**මීගමුව අධ්‍යාපන කලාපය**
**දෙවන වාර ඇගයීම - 2025**
**ඉතිහාසය**

විභාග අංකය:..........................................

| | | |
|---|---|---|
| **10 ශ්‍රේණිය** | **II පත්‍රය** | **කාලය පැය 3** |

පොදු උපදෙස් :

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

I කොටස

(01) (අ) පහත i යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද, ii යටතේ සපයා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

i . දඹකොලපටුන, කලා වැව, ගෝකණ්ණ, ලංකාපටුන, තිරුකේතීෂ්වරම්, පරාක්‍රම සමුද්‍රය, මිනිහාගල්කන්ද, කළුගඟ, දෙවුන්දර, ගොඩවාය, සොරබොරවැව, සල්වතොට

ii . බ්‍රිතාන්‍යය, රතු මුහුද, අරාබිය, මලක්කා සමුද්‍රසන්ධිය, බෙංගාලබොක්ක, චීනය

(ලකුණු 18)

(ආ) A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාල පුද්ගලයින් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ දක්වන්න.

A ශ්‍රී ලංකාවේ සිතියමක් අදින ලද භූගෝල ශාස්ත්‍රඥයා -
B සිත්නාරුබිම බුදල්නා හට කළගුණ සළකනු පිණිස පනාකඩුව තඹ සන්නස කරවූ රජතුමා -
C ශ්‍රී ලංකාව ජනාවාස වීම හා සම්බන්ධ මානවයා හඳුන්වන නම -
D ලම්භකර්ණ රාජවංසයේ ආරම්භක රජතුමා -

(ඇ) A හා B යටතේ ඇති රූප අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

1. A රූපයේ දැක්වෙන ශිලාලිපිය කුමක්ද?
2. එය කරවන ලද රජුගේ නම කුමක්ද?
3. මෙය කවර සෙල්ලිපි වර්ගයට අයත් ද?
4. මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක්ද?



A

1. B රූපයේ දැක්වෙන නිර්මාණය කුමක්ද?
2. මෙය සොයාගෙන ඇත්තේ කවර ස්තූපයක කරන ලද කැනීම් වලින්ද?
3. මෙය නිර්මිත ලෝහය කුමක්ද?
4. මෙම පුරාවස්තුව සොයාගත් ස්තූපය ඉදිකරන ලද්දේ කවර රජෙකුගේ උපත සිහිවීම පිණිස ද?



B

(ලකුණු 12)

II කොටස

(02) i. ශ්‍රී ලංකාවට පැමිණ ලංකාව දැක බලා ලංකාව පිළිබඳ වාර්තා තැබූ විදේශිකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 3)
i. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැළකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 4)
iii. පුරාවස්තු රැකගැනීමේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iv. ඉතිහාසය ඉගෙනගැනීමේ ප්‍රයෝජන තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(03) i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ ලෙන් වාසස්ථාන තුනක් ලියන්න. (ලකුණු 3)
ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජීවන රටාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)
iii. පූර්ව ඓතිහාසික යුගයේ පැවති අවමංගල්‍ය චාරිත්‍ර දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

(04) i. පූර්ව රාජ්‍ය සමයේ රාජ්‍ය පාලනයට සම්බන්ධවූ “ගමික” සතු කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 3)
ii. A රාජත්වය හා සම්බන්ධ සංකල්ප දෙකක් ලියන්න. (ලකුණු 2)
B පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සිදුවූ ආකර දෙකක් ලියන්න. (ලකුණු 2)
iii. දේවානම්පියතිස්ස රජ සමයේ සිදුවූ ඓතිහාසික සිද්ධීන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iv. රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කළ සේවාවන් තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

(05) i. ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න. (ලකුණු 3)
ii. අතීතයේදී රටේ ජනතාවගේ පොදු සෞඛ්‍ය පහසුකම් නගාසිටුවීමට කටයුතු කළ රජවරු හතරදෙනෙකු නම් කරන්න. (ලකුණු 4)
iii. අතීත ලංකාවේ ‘කෘෂිකර්මාන්තය’ සංවිධානයවී තිබූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)
iv. පැරණි ලංකාවේ පැවති කර්මාන්ත නම් කර එය දියුණු මට්ටමක පැවති බව කර්මාන්ත තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(06) i. පහත සඳහන් වැව් හා ඇළමාර්ග තැනවූ රජවරු නම් කරන්න.
A කලා වැව -
B කවුඩුල්ල වැව -
C ඇළහැර ඇළ - (ලකුණු 3)
ii. වියළි කලාපයේ වැව් පද්ධති තැනීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 4)
iii. A දුටුගැමුණු රජුගේ සෙන්පති තනතුර ලැබීමට පෙර පරුමක වරු ලෙස කටයුතු කල පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)
B පරුමකවරුන් ගෙන් සිදුවූ සේවාවන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)
iv. වසභ රජු වාරි කර්මාන්තයේ උන්නතියට කල සේවාවන් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(07) i. කෙටි පිළිතුරු ලියන්න.

A අකුණු සැර වලින් ආරක්ෂා වීම සඳහා විශාල ස්ථූප මුදුනේ සවිකල උපකරණය -

B කුඩා ස්තූප ආවරණය කිරීම සඳහා තැනූ ගොඩනැගිල්ල -

C අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මහා සාගරයට ගලා නොයා යුතුය යන ප්‍රකාශය ඉදිරිපත් කල රජතුමා - (ලකුණු 3)

ii. A ඇළහැර ඇලෙන් පෝෂණය වන වැව් දෙකක් ලියන්න (ලකුණු 2)

B භික්ෂූන්වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිවූ පොකුණු දෙකක් ලියන්න. (ලකුණු 2)

iii. උද්‍යාන අලංකරණය හා ආරක්ෂාව පදනම් කරගෙන සීගිරිය නිර්මාණය කර ඇති බව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv. A වැවක ප්‍රධාන අංග තුනක් නම් කරන්න (ලකුණු 3)

B එම අංග වලින් සිදුවන කාර්යයන් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 3)

(08) i. මෙරට පැරණි සමාජයේ ඉහළ ස්ථරයේ සිටි පාර්ශවයන් තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. වෙළඳාම ක්‍රමවත්ව පවත්වා ගැනීම සඳහා iv වන උදය රජතුමා පැනවූ නීති (බදුලු ටැම් ලිපිය) දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. අතීත සමාජයේ සිටි ගෘහනිය ආහාර රසවත් කිරීමට යෙදූ ක්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv. පැරණි සමාජයේ මෙරට කාන්තාවට ගෞරවනීය තත්වයක් හිමිව තිබූ බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)